**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය - 2017**

**-----------------------------------------------------------**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 14(4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 මතය

---

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 ලැබිය යුතු ගිණුම්

---

පහත දැක්වෙන නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියට ලැබිය යුතු එකතු කල අගය මත බදු වටිනාකම රු.මිලියන 117.46 ක් විය. එම ශේෂය පෙර වර්ෂයේ පැවති රු.මිලියන 59.50 හා සැසඳීමේ දී රු.මිලියන 57.97 කින් හෙවත් සියයට 97 කින් වර්ධනය වී තිබුණි. ආයතනය තුල නිමවුම් බදු ප්‍රමාණවත් පරිදි නොතිබීමෙන් මෙම වටිනාකම දිගු කාලීනව එකතු වෙමින් තිබූ බව නිරීක්ෂණය විය. මෙම මුදල අයකර ගැනීම පිළිබඳ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පැවතිය ද මෙතෙක් අවසාන නිගමනයකට එළැඹ නොතිබුණි. මේ හේතුවෙන් එම මුදල අයකර ගැනීම අවිනිශ්චිත බව නිරීක්‍ෂණය විය.

(ආ) අධිකාරිය විසින් ප්‍රතිපූර්නය කිරීමේ පදනම මත මඩකලපුව ගුවන් තොටුපල ඉදිකිරීමේ කටයුතු සඳහා 2016 වර්ෂයේ දී වැය කරන ලද රු.මිලියන 18.97 ක් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයෙන් 2017 වර්ෂය අවසාන වන විට ද ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඞී1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2 ඡේදය | රාජ්‍ය ආයතන වෙත පොදු ප්‍රවාහන පහසුකම් ලබාදිය හැකි උපරිම සීමාව ඒමට හා යාමට දුර කි.මී.100 ක් වුවත් අධිකාරියේ ප්‍රධාන කාර්යාලය කටුනායක ස්ථානගත කිරීම හේතුවෙන් එහි කාර්යය මණ්ඩලයට සේවයට වාර්තා කිරීම සඳහා දොඩම්ගොඩ සිට කටුනායක දක්වා බස් රථයක් සඳහා දෛනිකව රු. 16,800 ක් ගෙවීමේ පදනම මත ඒමට හා යාමට කි.මී.188 ක දුර ගමන් කිරීම සඳහා බස් රථයක් යොදාගෙන තිබුණි. |
| (ආ) | 2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 වගන්තිය | අධිකාරිය යටතට ගැනෙන වාහන පිළිබඳ මුල් වාර්තාව ලබාදීමත්, ලබා දිමෙන් පසුව ඒ සම්බන්ධයෙන් සිදු වන වෙනස්කම් ආකෘති පත්‍ර ප්‍රකාරව සෑම කාර්තුවක් අවසානයේ එළඹෙන මස 15 දිනට ප්‍රථමව කළමනාකරණ සේවා විගණන දෙපාර්තමේන්තුව වෙත යැවීමට සැලැස්විය යුතු වුවත් අධිකාරිය විසින් 2017 වර්ෂය තුලදී එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2008 මැයි 22 දිනැති අංක 1550/7 දරන ගැසට් නිවේදනයේ 8 වන වගන්තිය | අධිකාරිය එකතු කරන විදේශීය විකුණුම් අධිභාරය ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුම සකස් කර නොතිබුණි. 2017 වර්ෂයේ දී මේ ආකාරයට අධිකාරියේ ගිණුමට එකතු කර තිබූ විදේශීය විකුණුම් අධිභාරය රු.මිලියන 1,525.63 ක් විය. |
| (ඈ) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2050/38 දරන ගැසට් නිවේදනය | ගුවන් සේවා සැපයුම් ආයතනය විසින් දැනට භාවිතා කරන කටුනායක ගුවන් තොටුපල, රත්මලාන ගුවන් තොටුපල හා තවත් ස්ථාන 7 කට අදාලව පිහිටි ගගණගාමී පහසුකම් හා අනුයුක්ත ඉඩම් සිවිල් ගුවන් සේවා අධිකාරියට පවරා තිබුණි. ගුවන් සේවා අධිකාරි පනතේ 88 වගන්තිය පරිදි අධිකාරිය විසින් නිගමනය කරන කොන්දේසි මත නැවත මෙම ඉඩම් ගුවන් සේවා සැපයුම් ආයතන වෙත පවරාදිය යුතු වුවත් එම කටයුතු 2018 අප්‍රේල් 30 දින දක්වාම නිමකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ සමස්ථ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 1,042.91 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 881.14 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 161.77 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පෙර වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් ආදායම රු.මිලියන 304.31 කින් හෙවත් සියයට 20 කින් ද, මෙහෙයුම් නොවන ආදායම රු.මිලියන 29.02 කින් හෙවත් සියයට 18 කින් ද වර්ධනය වීම හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 කට අදාල මෙහෙයුම් ලාභ, සේවක පාරිශ්‍රමික, විවිධ බදු වර්ග යනාදී වශයෙන් ජාතික ආර්ථිකයට එකතු කළ අගයන් පිළිබඳ පරීක්ෂාවේදී 2013 වර්ෂයේදී රු.මිලියන 1,002.81 ක් වූ දායකය 2017 වර්ෂය වන විට රු.මිලියන 1,792.98 දක්වා වර්ධනය වී තිබුණි. මේ සඳහා සේවක පාරිශ්‍රමික හා ආදායම් බදු ගෙවීම්වල ක්‍රමිකව සිදු වූ වර්ධනය ප්‍රධාන හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක් සඳහා වූ ප්‍රමාණාත්මක අනුපාත හා ප්‍රතිශතයන් පහත දැක් වේ.

| | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|
| පිරිවැටුමට ශුද්ධ ලාභ අනුපාතය (සියයට) | 74 | 74 | 77 | 76 | 69 |
| පිරිවැටුමට සේවක මණ්ඩල පිරිවැය (සියයට) | 14 | 14 | 12 | 11 | 13 |
| ජංගම අනුපාතය | 2.2:1 | 2.85:1 | 3:1 | 3:1 | 2.4:1 |

පිරිවැටුමට සේවක මණ්ඩල පිරිවැය 2013 වර්ෂයට සාපේක්ෂව 2014 දී අඩුවීමක් පෙන්නුම් කළ ද එය 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විට ක්‍රමයෙන් වැඩි වන බව ද, 2014 වර්ෂයේදී 3:1 ක්ව පැවති ජංගම අනුපාතය 2016 වර්ෂයේ සිට ක්‍රමයෙන් අඩු වන බව ද නිරීක්ෂණය විය.
වත්කම්, ස්කන්ධය හා වගකීම්වල සංචලනයන් සැලකීමේදී 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී මුළු වත්කම් රු.මිලියන 1,188.06 කින් හෙවත් සියයට 33 කින් හා ස්කන්ධය රු.මිලියන 668.14 කින් හෙවත් සියයට 27 කින් ද වර්ධනය වී තිබූ අතර, මුළු වගකීම් රු.මිලියන 519.92 කින් හෙවත් සියයට 45 කින් ද වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

අධිකාරිය 2016 සිට 2018 දක්වා වූ වර්ෂ 03 ක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ලඟා කර ගැනීමට හැකි වන පරිදි අධිකාරියේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමට සැලසුම් කර තිබුණි. 2018 වර්ෂය සඳහා අධිකාරියේ සියළු මෙහෙයුම් කාර්යයන් ආවරණය වන පරිදි කාර්යභාරයන් 18 ක් හඳුනාගෙන ඊට අනුරූපී ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් (Key performance Indicators) හඳුන්වා දී තිබූ නමුත් ඊට අනුකූල වන ආකාරයට කාර්යසාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

2010 වර්ෂයේදී ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) නිකුත් කරන ලද රාජ්‍ය නිරුපද්‍රිතතා සංක්ෂිප්ත වාර්තාව අනුව රටවල් 191 ක් අතුරින් ශ්‍රී ලංකාව 19 වන ස්ථානයට පත්වී තිබුණි.

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනතේ සඳහන් පරිදි ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තිය සකස් කර ගැනීම සඳහා අධිකාරිය විසින් අමාත්‍යවරයාට සහය විය යුතුය. ඒ අනුව වසර කිහිපයකට පෙර ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තියක් සැකසීම ආරම්භ කර තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි. ජාතික ගුවන් සේවා ප්‍රතිපත්තියක් නොමැති නිසා ගුවන් සේවා සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ නොහැකි වී තිබෙන බව ද සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

#### 4.1.3 ගුවන් සේවා සුරක්ෂිතතා අංශයේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක් සඳහා සෝදිසි කාර්යයන් (Surveillances) ප්‍රගතිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සිවිල් ගුවන් සේවා අධිකාරියේ ගුවන් සේවා සුරක්ෂිතතා (Aviation Security) අංශය විසින් 2016 සහ 2017 වර්ෂයන්ට අදාලව කළ යුතුව තිබූ සෝදිසි (Surveillances) පරීක්ෂණ ගණන පිළිවෙලින් 47 ක් සහ 32 ක් බව වාර්ෂික පරීක්ෂණ සැලැස්මේ සඳහන්ව තිබුණ ද තථ්‍ය වශයෙන් ක්‍රියාත්මක කර තිබූ පිරික්සුම් ගණන පිළිවෙලින් 29 ක් සහ 18 ක් විය.

(ii) 2017 වර්ෂයේදී ගුවන් සේවා සුරක්ෂිතා සෝදිසි කාර්යයන් වැඩ සටහන අනුව පරීක්ෂණ (Test) 03 ක් සැලසුම් කර තිබුණ ද කිසිදු පරීක්ෂාවක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.2** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 55 හා 56 වගන්තිවල විධිවිධාන අනුව ගුවන් අනතුරු සහ බරපතල ගුවන් අනතුරු පිළිබඳව පරීක්ෂා කර ගුවන් සේවා අධිකාරියට වාර්තා කිරීම සඳහා එක් එක් සිද්ධියට අදාලව විමර්ශණ මණ්ඩලයක් පත්කර තිබුණි. කෙසේ වුවත් 2010 වර්ෂයේදී ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින් ඉදිරිපත් කරන ලද විගණන වාර්තාව අනුව ඉහත සඳහන් විමර්ශන මණ්ඩලය වෙනුවට ස්ථාවරව ක්‍රියාත්මක විය යුතු “ගුවන් අනතුරු පරීක්ෂණ ස්වාධීන අධිකාරියක්” පිහිටුවිය යුතු බවට අවධාරණය කර තිබුණි. නමුත් එම ස්වාධීන අධිකාරිය ස්ථාපිත කිරීමට අදාල කටයුතු 2017 වර්ෂය අවසන් වන විට ද මූලික අවස්ථාවේ පැවතුණි.

(ආ) 2016 ජූලි 01 දිනැති අංක 1973/78 දරන ගැසට් නිවේදනය අනුව මඩකලපුව ගුවන් තොටුපල, සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත පවරා දී තිබුණි. 2017 වර්ෂයේදී එම ගුවන් තොටුපල පිහිටි ඉඩම රු.මිලියන 495.82 ක වටිනාකමට තක්සේරු කර ගිණුම්වල ඇතුලත් කර තිබූ නමුත් එයට අදාල ඉඩම් ඔප්පු 2018 ජූනි 30 දින වන විටත් ලබාගෙන නොතිබුණි.

(ඇ) මඩකලපුව ගුවන් තොටුපලේ පියාසර පාසලක් පවත්වා ගෙන යාම සඳහා 2017 සැප්තැම්බර් 21 දිනැති පුවත්පත් දැන්වීමට අනුව ඉදිරිපත් වූ එකම අයදුම්කාර ආයතනය, අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත තෝරාගෙන තිබුණි. එම ආයතනය විසින් 2017 සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ව්‍යාපාර සැලැස්ම (Business Plan) 2018 ජූනි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**4.3** **මෙහෙයුම් ක්‍රියාකාරකම්**

ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින් 2010 වර්ෂයේ දී සිදු කරන ලද රාජ්‍ය නිරුපද්‍රිතතා විගණනයේ දී අධිකාරියේ එක් එක් අංශයන්ට අදාලව නිවැරදි කරගත යුතු දුර්වලතා 80 ක් නිවැරදි කර ගැනීමට නිර්දේශ කර තිබුණි. නියැදි විගණනය පරීක්ෂණ අනුව එයින් ගගණ නාවික සේවා අංශය සහ අනතුරු විමර්ශන අංශයන්ට අදාලව ඉදිරිපත් කරන ලද දුර්වලතා 07 න් 02 ක් පහත පරිදි වේ.

| | **දුර්වලතාවය** | **නිවැරදි කිරීමේ නිර්දේශය හා ඉලක්ක දිනයන්** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| (i) | කලාපයේ අනිකුත් රටවල් සමඟ ගුවන් ගමන් බිඳ වැටීම්, විභව බිඳ වැටීම්, ගුවන් ගමනාගමන සේවා සහ සම්බන්ධිත සහයක සේවාවලට අදාලව අවස්ථානුකූල සැලසුමක් සකස් නොකිරීම. | 2011 දෙසැම්බර් 31 දිනට දුර්වලතාවය මග හැරෙන පරිදි කලාපයේ රටවල සමඟ එකඟතා ගිවිසුමක් අත්සන් කිරීම. | රටවල් සමඟ ගිවිසුම් සඳහා එකඟ වී තිබුණ ද රාජ්‍ය තාන්ත්‍රිකව අදාල ගිවිසුම් අත්සන් කර නොතිබුණි. |
| (ii) | කාලගුණ දත්ත සපයන පාර්ශවය විසින් තම ආයතනය තුල සංවිධාන ගුණාත්මක සේවා (Quality Service) ක්‍රමවේදයක් ස්ථාපිත නොකිරීම. | 2011 දෙසැම්බර් 31 දිනට පෙර ගුණාත්ව ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව තුල අදාල ක්‍රමවේදය ස්ථාපිත කර ඇති බවක් තහවුරු නොවීය. |

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අධිකාරියේ සේවකයින් සඳහා 2016 වර්ෂයේ සේවක පාරිතෝෂික සඳහා වෙන්කිරීම මාසික වැටුපෙන් භාගයක් පදනම් කරගෙන ගණනය කර තිබූ නමුත් 2017 වර්ෂයේදී මාසික වැටුප පදනම් කරගෙන සේවක පාරිතෝෂික සඳහා වෙන්කිරීම් සිදුකර තිබුණි. ඒඅනුව සමාලෝචිත වර්ෂයට අදාලව පාරිතෝෂික වෙන්කිරීම් ගිණුම රු.මිලියන14.30 කින් අධිගණනය වී තිබූ අතර වර්ෂය තුලදී නිලධාරීන් 06 දෙනෙකු වෙනුවෙන් රු. මිලියන6.28 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් මත්තල ගුවන් තොටුපල තුල රු.මිලියන 45.04 ක් වැය කර වර්ග අඩි 1200 ක කාර්යාලයක් ඉදිකර තිබුණි. නමුත් 2017 වර්ෂය තුල ගුවන් තොටුපල මෙහෙයුම් කටයුතු අඩු වීම හේතුවෙන් එම කාර්යාලය ඌන උපයෝජිතව පැවතුණි.

## 4.6 අනාර්ථික ගණුදෙනු

කටුනායක පිහිටි නව කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ කටයුතු අධීක්ෂණය හා උපදේශනය සඳහා රු.මිලියන 24.40 ක ගාස්තුවක් ගෙවීමේ පදනම මත ඉංජිනේරු සේවා උපදේශක සමාගමකට පවරා තිබියදී රු. 250,000 ක මාසික දීමනාවක් ගෙවීමේ පදනම මත එම කටයුතු සඳහා සිවිල් ඉංජිනේරුවෙකු සහ ඔහුගේ සහයට කාර්යාල කාර්ය සහායකයෙකු 2016 ජනවාරි සිට සේවයේ යොදවා තිබුණි. 2018 මාර්තු දක්වා ඔවුන් දෙදෙනා වෙනුවෙන් දරන ලද රු.මිලියන 8.77 ක් වූ වියදම් අනාර්ථික වියදම් බව නිරීක්ෂණය විය.

## 5 තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. කෙසේ වුවද එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ද එම ඉලක්ක කරා ලඟා විය යුතු සංධිස්ථානයන්ද ඉලක්ක මත ලඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 අභ්‍යන්තර විගණනය

අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය 2017 වර්ෂය සඳහා විගණන වැඩ සැලැස්මක් සකස් කර තිබුණ ද, අධිකාරියේ භෞතික කාර්යසාධනය පිළිබඳව ප්‍රමාණවත් ඇගයීමකට ලක් වන පරිදි විගණනයක් සිදු කර නොතිබුණි.

## 6.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) කටුනායක ඉදිකළ අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ 2017 ජූනි 13 දින වැඩ අවසන් කිරීමට නියමිතව පැවතුණි. තවද මෙම කටයුතු අංක අමප/17/1019/709/041 දරන 2017 ජූනි 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව, 2017 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි. එහෙත් අපේක්ෂිත පරිදි සැප්තැම්බර් 30 දිනට ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබූ නමුත්, අධිකාරිය 2018 ජනවාරි මාසයේදී එම ගොඩනැගිල්ලෙහි පදිංචි වී තිබුණි. කෙසේ වුවද ඉදිකිරීම් කටයුතු ප්‍රමාද කිරීම හේතුවෙන් 2017 ඔක්තෝබර් 01 දින සිට හුණුපිටිය පිහිටි ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය කුලී ගොඩනැගිල්ල වෙනුවෙන් මාස 03 ක් සඳහා අමතරව ගෙවා තිබූ ගොඩනැගිලි කුලී වියදම රු.මිලියන 14.91 ක් විය.

(ආ) ඉහත "අ" හි සඳහන් කටුනායක ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2018 ජනවාරි මාසයේදී විවෘත කර තිබුණ ද 2018 මාර්තු 19 දින වන විට තවදුරටත් එහි මූලික ක්‍රියාකාරකම් 22 න් Flag Posts, Boards, terrace Works යන කාර්යයන් 03 ආරම්භ කර නොතිබූ අතර, තවත් කාර්යයන් 04 ක සම්පූර්ණත්වය සියයට 15 සිට සියයට 75 අතර මට්ටමේ පැවතුණි.

## 6.3 අයවැය පාලනය

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 803.37 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දිනට එයින් රු.මිලියන 281.22 ක ඉදිකිරීම් සම්පූර්ණ කර තිබුණි. ඒ සඳහා තවදුරටත් දැරිය යුතු රු.මිලියන 522.15 ක පිරිවැයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 760 ක මුල්‍ය ප්‍රතිපාදනය කර තිබූ අතර, 2017 වර්ෂයේදී රු. මිලියන 307.94 ක් හෙවත් ප්‍රතිපාදන මුදලින් සියයට 40 ක් පමණක් වැය කර තිබුණි. මේ නිසා ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් වෙන් කළ මුදල හා වැය කළ මුදල අතර රු.මිලියන 452.06 ක් හෙවත් සියයට 60 ක අතිරික්ත වෙන් කිරීමක් නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පරිපාලනය | ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම |
| (ආ) | ලැබිය යුතු මුදල් | අයකර ගැනීම ප්‍රමාද වීම |
| (ඇ) | වත්කම් පාලනය | ගිවිසුම්ගත බැඳීමකට පැමිණ ඉඩම් පවරා ගැනීමට කටයුතු නොකිරීම |
| (ඈ) | කාර්ය සාධනය | සැලසුම්ගත පරිදි සෝදිසි පර්යේෂණ සිදු නොකිරීම |